# පොළොන්නරු සාහිත්‍යය සහ සමකාලීන දෘශ්‍ය කලා

අංජලී වික්‍රමසිංහ

Although thousands of years have elapsed since the downfall of the Polonnaruwa period, the glories of it are not lost and there are enough remains to get an idea of its former grandeur. The art of the Polonnaruwa period is greatly affected by Mahayana and Hindu influences. Techniques adopted and the socio cultural background of the period too portrays a different identity. In comparison with the literature of Anuradhapura period, literary works of the Polonnaruwa era can be conceded as unique in terms of form and content. Vividness reflected in contemporary literary works is reflected in the sculptures also.

ශ්‍රී ලාංකේය සාහිත්‍ය ඉතිහාසය සමාලෝචනය කිරීමේ දී පොළොන්නරු යුගය සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය මෙන් ම මාතෘ භාෂා සාහිත්‍යය ද සංවර්ධනය වූ කාල පරිච්ඡේදයක් සේ හැඳින්වීමට අදාළ වන සාධක හමුවේ. මේ යුගයේ දී සිංහල ග්‍රන්ථ රාශියක් ලියවී තිබේ. ගද්‍ය පද්‍ය මෙන් ම සාහිත්‍ය විචාරය ද දියුණු තලයකට පත් ව තිබෙන්නට ඇති බව එම කෘති පරිශීලනයෙන් අවබෝධ වෙයි. පාලි, සංස්කෘත භාෂා ද්වයෙහි ම ඇසුර සිංහල සාහිත්‍යයට ලැබුණු අතර වස්තු විෂය සඳහා පාලි සාහිත්‍යයත්, වස්තු අලංකරණය සඳහා සංස්කෘත සාහිත්‍යයත් පිහිට කොට ගැනිණි. සන්න, ගැටපද, පරිකථා, ව්‍යාකරණ ග්‍රන්ථ, බුද්ධ චරිතය, බුද්ධ ධර්මය හා ශාසන ඉතිහාසය විෂය කොටගත් ගද්‍ය හා පද්‍ය ග්‍රන්ථ මේ යුගයේ බිහිවිය.

පොළොන්නරු යුගයේ ලියවුණු සන්න හා ගැටපද අතර වෙසතුරු ගාථා සන්නය, මහාබෝධිවංශ ග්‍රන්ථිපදය, ජාතකට්ඨකථා

© අංජලී වික්‍රමසිංහ

සංස්. පූජ්‍ය නැදලගමුවේ ධම්මදින්න හිමි, උදිත ගයාෂාන් ගුණසේකර, ස්වර්ණා ඉහලගම, කොෂලයා පෙරේරා

මානවශාස්ත්‍ර පීය ශාස්ත්‍රීය සංග්‍රහය, 14 කලාපය, 2010, මානවශාස්ත්‍ර පීයය, කැලණිය විශ්වවිද්‍යාලය